---

**නැගෙනහිර පළාත් සභාව - 2013**

---

නැගෙනහිර පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ. මෙම වාර්තාවේ දැක්වෙන නිරීක්ෂණයන් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී පළාත් සභාවේ සභාගත කිරීම සඳහා නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(අ) මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසක් වශයෙන් වෙනස්වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2014 මැයි 31 දිනට සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | ගිණුම් වර්ගය | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කරන ලද ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකරන ලද ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 34 | 34 | - |
| (ii) | ආදායම් ගිණුම් | 01 | - | 01 |
| (iii) | පළාත් රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් | 34 | 33 | 01 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 08 | - | 08 |
| (v) | අරමුදල් ගිණුම් | 02 | 01 | 01 |
| (vi) | ව්‍යවස්ථාපිත ගිණුම් | 02 | 01 | 01 |
| | එකතුව | 81 | 69 | 12 |

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් එකතු කිරීමට අදාළව 2013 දෙසැම්බර් 31 දිනට පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීම් ගිණුම් 03 ක පැවති එකතුව රු.667,440,011 ක් වූ ශේෂයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

---

(ආ) පළාත් අමාත්‍යාංශ 5 කට හා පළාත් දෙපාර්තමේන්තු 29 කට අයත් විවිධ වර්ගයේ වාහන 580 ක් අගය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවේ ජංගම නොවන වත්කම්වල මුළු වටිනාකම ගණනය කිරීමේදී රු.173,655,920 ක් වූ ආරම්භක ශේෂය ගිණුම් වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජංගම නොවන වත්කම්වල මුළු වටිනාකම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) එකතුව රු.2,342,758 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ දෙකක් මූල්‍ය ප්‍රකාශනවල වගකීම් ලෙස වෙනම දක්වා නොතිබූ අතර ඒ වෙනුවට එම ශේෂයන් ලැබිය යුතු මුළු ශේෂයට හිලව් කර ශුද්ධ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ලැබිය යුතු ශේෂය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අනුව සමාලෝචිත වර්ෂය තුළ ආපසු ගෙවිය යුතු තැන්පතු නිරවුල් කිරීම රු.393,313,649 ක් විය. කෙසේ වුවද තැන්පතු වලින් මුදල් ගලායාම ලෙස රු.22,870,235 ක මුදලක් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැන්පතු ගිණුමට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සහ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන වාර්තාවල දැක්වෙන ශේෂය අතර රු.17,549,097 ක වෙනසක් නිරීක්ෂණය විය. වෙනස සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ආ) පළාත් දෙපාර්තමේන්තුවකින් ලැබිය යුතු අග්‍රිම ශේෂයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල හා පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන ගිය වාර්තාවල දැක්වෙන මුදල අතර රු.19,444,844 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් විෂයයන් 4 ක ආදායම එකතු කිරීමට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල හා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන වාර්තාවල දැක්වෙන මුදල අතර රු.92,344,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

---

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාවේ ආයතන 9 ක එකතුව රු.35,811,107 ක් වූ සේවක ණය ශේෂයන් වර්ෂ 4 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද හිඟ ශේෂයන් ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු එකතුව රු.13,601,853 ක් වූ හිඟ ණය ශේෂයන් ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට පළාත් අමාත්‍යාංශ 2 ක් හා දෙපාර්තමේන්තු 23 ක් විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරුන් 20 කට අදාළව එකතුව රු.1,017,480 ක් වූ හිඟ ණය ශේෂයන් වර්ෂ 1 ½ කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. කෙසේ වුවද, හිඟ ණය ශේෂයන් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 49 ක් සඳහා පිළිතුරු 2014 ඔක්තෝබර් 31 දක්වා ඉදිරිපත් කර නොතිබුණු අතර එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.47,970,562 ක් විය.

(ආ) පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | මුදල | විගණනයට ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| -------- | ------ | -------------------------------- |
| | රු. | |
| වාහන | 83,816,810 | ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, වාහන ලේඛනය |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 123,020,002 | |
| පිරියත, යන්ත්‍ර හා උපකරණ | 36,797,807 | |
| ගොඩනැගිලි හා ව්‍යුහයන් | 668,254,031 | |
| ඉඩම් | 5,426,390 | ස්ථාවර වත්කම් ලේඛනය, ඉඩම් ඔප්පු |

## 2.2.6 නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| මුදල් රෙගුලාසි 571 | පළාත් අමාත්‍යාංශ 02 ක සහ දෙපාර්තමේන්තු 06 ක වර්ෂ දෙකකට වැඩි කාලයක් පැවති එකතුව රු.16,323,628 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**(ආ) නැගෙනහිර පළාත් මුදල් රෙගුලාසි**

| | | |
|---|---|---|
| (i) | පළාත් මුදල් රීති 215 | සියළුම අග්‍රිම ශේෂ ඊළඟ මූල්‍ය වර්ෂයේ පළමු වැඩ කරන දිනයේදීම පළාත් භාණ්ඩාගාරයට ආපසු යැවිය යුතුය. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.10,340,292 ක් වූ අග්‍රිම ශේෂ පළාත් දෙපාර්තමේන්තු 03 ක් විසින් 2014 ඔක්තෝබර් 31 දින දක්වා නිරවුල් නොකර පැවතුණි. |
| (ii) | පළාත් මුදල් රීති 258.3 | නැගෙනහිර පළාතේ ඒකාබද්ධ වාර්ෂික ආදායම් ප්‍රකාශන හා ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශන 2014 අප්‍රේල් 30 දිනට හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2008 සිට 2013 වර්ෂයන් සඳහා එම ඒකාබද්ධ ප්‍රකාශන 2014 ඔක්තෝබර් 31 දින දක්වාත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | පළාත් මුදල් රීති 326.2 | 2013 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ ස්ථාවර වත්කම් උපයෝජන ප්‍රකාශනය 2014 අප්‍රේල් 30 දිනට හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, එම ඒකාබද්ධ ප්‍රකාශන පිළියෙල කර 2014 ඔක්තෝබර් 30 දක්වාත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | පළාත් මුදල් රීති 365 | දෙපාර්තමේන්තු 05 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |

**(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006**

**------------------------------------------**

| | |
|---|---|
| 2.8.2 පරිච්ඡේදය | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ විනිවිද භාවය වැඩි කිරීමට හැකි වන පරිදි තාක්ෂණ ඇගයීම් කමිටුව අවම වශයෙන් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. කෙසේ වුවද, පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලයට අදාළව තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා එක් සාමාජිකයකු පමණක් පත් කර තිබුණු අතර රු.මිලියන 20.6 ක මුළු ඇස්තමේන්තු වටිනාකමට කොන්ත්‍රාත්තු 22 ක් ප්‍රදානය කර තිබුණි. |

**(ඇ) චක්‍රලේඛ**

**-----------**

**(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**-----------------------------**

| | |
|---|---|
| ★ 2007 මැයි 11 දිනැති අංක 09/2007 | චක්‍රලේඛ විධිවිධාන අනුව සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරු සඳහා විශ්‍රාමික රාජ්‍ය නිලධාරින්ගේ වැටුප පිළිවෙලින් රු.20,000 හා රු.17,500 ක් විය යුතු නමුත්, සභාපතිට රු.35,000 ක මුදලක් හා ක්‍රියාකාරි අධ්‍යක්ෂට රු.30,000 ක මුදලක් වැටුප් ලෙස පෙර පාසැල් අධ්‍යාපන කාර්යාංශය විසින් ගෙවා තිබුණි. ඒ අනුව කාර්යාංශය විසින් 2010 වර්ෂය සිට 2013 වර්ෂය දක්වා රු.1,654,500 ක මුදලක් විශ්‍රාමික රාජ්‍ය නිලධාරින් තිදෙනෙකුට වැටුප් ලෙස වැඩිපුර ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| ★ | 2007 අගෝස්තු 21 දිනැති අංක 09/2007 (1) | චක්‍රලේඛ විධිවිධානවලට අනුව, වයස අවුරුදු 67 ඉක්මවන කිසිදු පුද්ගලයකු රාජ්‍ය සේවයේ අනුමත තනතුරක් සඳහා කිසිදු කරුණක් වෙනුවෙන් පත් නොකළ යුතුය. කෙසේ වුවද වයස අවුරුදු 69 ක් වූ පුද්ගලයකු ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස පෙර පාසැල් අධ්‍යාපන කාර්යාංශය විසින් 2010 ජූනි 01 දින පත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් රු.1,290,000 ක මුදලක් ඉහත ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට වැටුප් ලෙස ගෙවා තිබුණි. |
| **(ii)** | **ජාතික අයවැය චක්‍රලේඛ** | |
| | 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන චක්‍රලේඛය | ආරාධනාපත්, දින පොත්, සුභ පැතුම්පත් මුද්‍රණය කිරීම ආදී කාර්යයන් සඳහා දරන ලද වියදම් සීමා කළ යුතු බවට උපදෙස් දී තිබුණද, එයට පටහැනිව පළාත් භාණ්ඩාගාරය හා සභා ලේකම් කාර්යාලය විසින් අවස්ථා 02 කදී රු.3,438,000 ක් වැය කරමින් සුභ පැතුම් පත් හා දින පොත් මුද්‍රණය කර තිබුණි. |
| ★ | **පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය** | |
| | 2013 දෙසැම්බර් 02 දිනැති අංක පීටී/09/2013 | 2013 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.56,888,623 ක් වූ විවිධ තැන්පතු වලට අදාළ වාර්ෂික තැන්පතු සැසඳුම් ප්‍රකාශනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | 2013 දෙසැම්බර් 23 දිනැති අංක පීටී/11/2013 | අමාත්‍යාංශ 04 ක් හා දෙපාර්තමේන්තු 07 ක් විසින් ප්‍රාග්ධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේ වැය කරන ලද එකතුව රු.231,722,276 ක් වූ මුදල් ජංගම නොවන වත්කම් සංචලනය යටතේ ගිණුම්වල දක්වා නොතිබුණි. |

## 3. ආදායම් කළමනාකරණය

විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, පසු ගිය වර්ෂ 05 තුළ එකතු කරන ලද මුළු ආදායම පහත දැක්වේ.

| විස්තර | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| බදු ආදායම | 1,860 | 1,496 | 1,354 | 951 | 137 |
| බදු නොවන ආදායම | 288 | 309 | 198 | 224 | 255 |
| එකතුව | 2,148 | 1,805 | 1,552 | 1,175 | 392 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය සඳහා පළාත් සභාව විසින් පිළියෙල කරන ලද ආදායම් ඇස්තමේන්තුවට අනුව, මත් පැන් බලපත්‍ර ගාස්තු වලින් ඇස්තමේන්තු කරන ලද ආදායම රු.30,000,000 ක් විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ මත්පැන් බලපත්‍ර ගාස්තු ලෙස එකතු කරන ලද ආදායම රු.15,211,496 ක් පමණක් විය.

(ආ) පළාත තුළ ක්‍රියාත්මක වන, බලයලත් මත් පැන් බෙදාහරින්නන් පිළිබඳ විස්තර පළාත් සභාව සතුව නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, පළාත තුළ ක්‍රියාත්මක වන සියළු බලයලත් බෙදාහරින්නන්ගෙන් බලපත්‍ර ගාස්තු එකතු කර ගැනීම සඳහා පළාත් සභාවට විධිමත් පරිදි කටයුතු කළ නොහැකි වී තිබුණි.

(ඇ) 2012 වර්ෂය සමඟ සැසඳීමේදී 2013 වර්ෂය තුළ ආදායම එකතු කර ගැනීම පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි. බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හරින බලයලත් බෙදා හරින්නන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත නොහැකිවීම හේතුවෙන් බලපත්‍ර ගාස්තු පැහැර හරින්නන්ට එරෙහිව පියවර ගැනීමට පළාත් සභාවට නොහැකි වී තිබුණි.

| දිස්ත්‍රික්කයේ නම | වර්ෂය තුළ එකතු කර ගන්නා ලද මුදල | |
|---|---|---|
| | **2013** | **2012** |
| | රු. | රු. |
| අම්පාර | 2,218,625 | 4,891,500 |
| මඩකලපුව | 12,992,871 | 16,665,538 |
| එකතුව | 15,211,496 | 21,557,038 |

(ඇ) ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුව පළාත් පාලන බල ප්‍රදේශය තුළ පිහිටි උසාවි මඟින් පනවන ලද දඩ සහ දේපල පැවරීම්වලට අදාළව පනවන ලද මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන විසින් ඉල්ලීම් කර නොතිබීම හේතුවෙන් අදාළ පළාත් පාලන ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව පළාත් සභාව විසින් රඳවා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් අදාළ පළාත් පාලන ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව 2013 දෙසැම්බර් 31 දිනට පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීම් ගිණුම්වල රු.667,440,011 ක මුදලක් පැවතුණි.

(ඉ) වරිපනම්, කුලී, කල් බදු ආදී ප්‍රධාන ආදායම් ප්‍රභවයන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතුණු එකතුව රු.447,402,104 ක් වූ ආදායම එකතු කර ගැනීම සඳහා නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 44 ක් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| **පළාත් පාලන ආයතනය** | **පළාත් පාලන ආයතන සංඛ්‍යාව** | **හිඟ මුළු මුදල** |
|---|---|---|
| | | රු. |
| මහ නගර සභා | 3 | 158,766,597 |
| නගර සභා | 5 | 148,675,423 |
| ප්‍රාදේශීය සභා | 36 | 169,960,084 |
| එකතුව | 44 | 477,402,104 |

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පළාත් සභා අරමුදලේ සමාලෝචිත වර්ෂය සඳහා රු.16,049,131 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.321,296,432 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.305,247,301 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ ලද සමූහ ප්‍රදාන රු.1,328,996,000 කින් වැඩිවීම හා ලැබුණු මුද්දර ගාස්තු රු.228,144,971 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ මුළු වියදම රු.මිලියන 21,050 ක් වූ අතර, ඉන් රු.මිලියන 14,042 ක මුදලක් පුනරාවර්තන වියදම සඳහා දරා තිබුණි. එය මුළු වියදමෙන් සියයට 67 ක් නියෝජනය විය. මුළු පුනරාවර්තන වියදමෙන් රු.මිලියන 11,176 ක මුදලක් පුද්ගලික පඩිනඩි සඳහා දරා තිබූ අතර එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 79 ක් නියෝජනය විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම රු.මිලියන 12,807 ක් වූ අතර එය එම වර්ෂය සඳහා මුළු වියදමෙන් සියයට 92 ක් නියෝජනය විය. තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මූලධන වියදම රු.මිලියන 5,873 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 5. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) පළාත් භාණ්ඩාගාරය විසින් වාණිජ අත්තිකාරම් ගිණුම් 8 ක් සඳහා ඇස්තමේන්තු පිළියෙල කර තිබුණද, වාණිජ අත්තිකාරම් ගිණුම් 03 ක් පමණක් ක්‍රියාත්මකව පැවතුණි. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවන වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු අවසන් කිරීම සඳහා පළාත් මුදල් රීති 286 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පරිගණකගත ප්‍රවාහන කළමනාකරණ පද්ධතියක් සහ කාල සටහන් ප්‍රදර්ශන පුවරු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා නැගෙනහිර පළාත් මාර්ග මගී ප්‍රවාහන අධිකාරිය රු.1,680,000 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වුවද සත්කාරක පහසුකම් නොමැතිවීම හේතුවෙන් එම පද්ධති 2014 ඔක්තෝබර් 17 විගණන දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. එබැවින් එම පද්ධති සංවර්ධනය කිරීම සඳහා දරන ලද වියදම ඵලරහිත වියදමක් බවට පත්ව තිබුණි.

(ඇ) පළාත් ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ලයිසන්ස් කීස් ( License Keys ) 56 ක් සඳහා පිරිවැය ඇතුළත්ව (Genuine Licenses and Manuals with DVD - OEM Genuine ) රු.4,386,000 ක මුළු පිරිවැයකට ඩෙස්ක්ටොප් පරිගණක 56 ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද සැපයුම්කරු විසින් එම "ලයිසන්ස් කීස් " පිරිවිතරයන්ට අනුව සපයා නොතිබුණි. ඒ අනුව "ලයිසන්ස් කීස් " එකක වෙළඳපොළ මිල රු.21,500 ක් වූ බැවින් රු.1,204,000 ක මුදලක් සැපයුම්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) රජයේ ඉඩම් සඳහා කල් බදු ආදායම් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක එකතුව රු.76,875,109 ක ආදායම 2009 වර්ෂය සිට 2013 දෙසැම්බර් 31 දක්වා හිඟව පැවතුණි. කෙසේ වුවද මෙම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි.

| **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම** | **2013 දෙසැම්බර් 31 දින දක්වා හිඟ ආදායම** |
|---|---|
| | රු. |
| කල්මුණේ | 215,000 |
| සමන්තුරෙයි | 513,975 |
| මන්මුනෙයි උතුර | 224,968 |
| නගර හා කඩවත් සතර | 11,422,260 |
| කුච්චවේලි | 64,498,906 |
| එකතුව | 76,875,109 |

## 5.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) තථ්‍ය අවශ්‍යතාවය සැලකිල්ලට ගැනීමෙන් තොරව ත්‍රිකුණාමලය ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශ කාර්යාලය විසින් වැඩිපුර ඖෂධ ලබාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.671,750 ක් වටිනා ඖෂධ කල් ඉකුත් වී තිබූ අතර එම කල් ඉකුත් වූ ඖෂධ 2013 දෙසැම්බර් 11 විගණන පරීක්ෂණ දිනය දක්වා ගබඩාවේ තබා තිබුණි.

(ආ) රු.4,844,631 ක් වටිනා තත්ත්වයෙන් බාල ඖෂධ වර්ග 12 ක්, වෛද්‍ය තාක්ෂණ හා සැපයුම් අංශ අධ්‍යක්ෂ කාර්යාලයට ආපසු භාර දීමට හෝ සුදුසු පියවරක් ගැනීමට කටයුතු කිරීමෙන් තොරව මුතූර්, මූලික රෝහලේ ගබඩාවේ තිබූ බව 2013 අගෝස්තු 13 සිදුකරන ලද විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(ඇ) රු.2,587,200 ක් වටිනා තත්ත්වයෙන් බාල ඖෂධ වර්ග 9 ක් වෛද්‍ය තාක්ෂණ හා සැපයුම් අංශ අධ්‍යක්ෂ කාර්යාලයට ආපසු භාරදීමට හෝ සුදුසු පියවරක් ගැනීමට කටයුතු කිරීමෙන් තොරව ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ ගබඩාවල තබා තිබූ බව 2012 සහ 2013 වර්ෂ තුළ සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(ඈ) වැනෙල්ලා, මුතූර්, කින්නියා, කච්චකොඩිතිවු හා නඩුත්තු ආදී රෝහල්, තථ්‍ය අවශ්‍යතාවය සැලකිල්ලට ගැනීමෙන් තොරව වැඩිපුර ඖෂධ ලබාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.3,378,355 ක් වටිනා ඖෂධ කල් ඉකුත් වී තිබූ අතර, එම කල් ඉකුත්වූ ඖෂධ 2013 අගෝස්තු 14 විගණන දිනය දක්වා ගබඩාවේ පැවතුණි.

## 5.3 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුරුක්කල්මඩම් අම්පිලන්තුරෙයි තොටුපළ බැවුම් මග අළුත් වැඩියා කිරීම සඳහා පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2013 මාර්තු 06 දින රු.519,100 ක පිරිවැයකට පිරිනමන ලද කොන්ත්‍රාත්තුව 2013 ජූනි 11 දින හෝ ඊට පෙර නිම කළ යුතු විය. කෙසේ වුවද ඉදිකිරීම් වැඩ 2014 නොවැම්බර් 30 වන විටත් ආරම්භ කර නොතිබුණි. එකඟ වූ කාල පරිච්ඡේදය තුළ වැඩ ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකිවී තිබුණද, අදාළ

බැංකුවෙන් කාර්ය සාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) මඩකලපුව, පළාත් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු විසින් පහත සඳහන් පළාත් මාර්ග 09 ක වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු නිම කිරීමේ නියමිත දින ඇතුළත නිම කළ බවට සහතික කර තිබුණද, මඩකලපුව මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු විසින් අදාළ වැඩ නිම කිරීමේ දිනයෙන් පසුව අදාළ කොන්ත්‍රාත්කරුවන් 9 දෙනාට ගල්කිල නිකුත් කර තිබුණි. ඒ අනුව ගබඩා භාරකරු විසින් නිකුත් කරන ලද රු.2,120,230 ක් වටිනා බිටුමන් ලීටර් 21,635 ක් ඒවා නිකුත් කරන ලද කාර්යය සඳහා යොදා ගෙන නොතිබුණි.

| වැඩෙහි ස්වභාවය | ප්‍රධාන ඉංජිනේරුගේ සහතිකයට අනුව නිම කිරීමේ දිනය | ගබඩා භාරකරුගෙන් ලබාගත් ප්‍රකාශනයට අනුව, බිටුමන් නිකුත් කරන ලද දිනය | වැඩ නිම කිරීමේ දිනයට පසුව නිකුත් කරන ලද බිටුමන් ප්‍රමාණය |
|---|---|---|---|
| | | | ලීටර් |
| තුරයිනීලවනයි තොටුපොළ මාර්ගය නඩත්තු කිරීම | 2013 දෙසැම්බර් 24 | 2013 දෙසැම්බර් 26 | 2,160 |
| රොසයිරෝ මාර්ගය නඩත්තු කිරීම | 2013 ජූනි 02 | 2013 ජූනි 11 | 575 |
| කලවන්චිකුඩි කුරුමන්වෙලි තොටුපොළ | 2013 ඔක්තෝබර් 08 | 2013 නොවැම්බර් 20 | 900 |
| කුඩියෙකුරුප්පු කාලිකෝවිල් මාර්ගය | 2013 ඔක්තෝබර් 05 | 2013 නොවැම්බර් 01 | 1,620 |
| ඔන්තාච්මඩම් මහිලූර් කුරුමන්වෙලි | 2013 දෙසැම්බර් 05 | 2013 දෙසැම්බර් 26 | 1,620 |
| පාර්තිව් පලුගමම් තම්ප් | 2014 දෙසැම්බර් 24 | 2014 ජනවාරි 17 | 1,620 |
| මිලන්කරච්චි මාර්ගය | 2013 නොවැම්බර් 12 | 2013 දෙසැම්බර් 23 | 6,120 |
| රොබට්සන් මාර්ගය | 2013 දෙසැම්බර් 10 | 2013 දෙසැම්බර් 11 | 2,340 |
| පන්කුඩාවලි මාර්ගය | 2013 නොවැම්බර් 29 | 2013 දෙසැම්බර් 20 | 4,680 |
| එකතුව | | | 21,635 |

## 5.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව 2006 ජනවාරි නිකුත් කරන ලද 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිද භාවය වැඩිදියුණු කිරීමට හැකිවන පරිදි තාක්ෂණ ඇගයීම් කමිටුව අවම වශයෙන් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. කෙසේ වුවද සිවිල් වැඩ වටිනාකම රු.මිලියන 2 ට අඩු අවස්ථාවකදී හා භාණ්ඩ හා සැපයුම් වටිනාකම රු.500,000 කට අඩු අවස්ථාවකදී තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා එක් සාමාජිකයකු පමණක් පත් කළ හැකි බව සඳහන් කර 2010 ජූලි 17 දිනැති අංක පීවී/09/2010 දරන චක්‍රලේඛයක් නිකුත් කිරීම මගින් පළාත් භාණ්ඩාගාරය විසින් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය උල්ලංඝණය කර තිබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියට සාවද්‍ය පරිචයන් සිදු කිරීමටද ඉඩ ලබාදී තිබුණි.

## 5.5 අරමුදල් ඌන උපයෝජනය

පළාත් සභාවේ සංවර්ධන වැඩ යෝජනා සඳහා ලබාගත් ප්‍රතිපාදන හා ඒ පිළිබඳ දරන ලද වියදම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | රජයේ ප්‍රදාන | තථ්‍ය වියදම | ඉතිරිය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| උපමාන පාදක ප්‍රදාන | 245 | 130 | 115 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,000 | 600 | 400 |
| වෙනත් ප්‍රදාන | 6,951 | 6,089 | 862 |
| | 8,196 | 6,819 | 1,377 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘති යටතේ සලසන ලද රු.100,000,000 ක් වූ සමස්ත ශුද්ධ ප්‍රතිපාදන අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරිවී තිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සලසන ලද මුළු ප්‍රතිපාදනවලින් සියයට 40 ක් නියෝජනය වන රු.400,000,000 ක් වූ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, රජය විසින් එහි සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අයවැයගත ප්‍රතිපාදන මඟින් ලබාදී තිබූ අවස්ථා පළාත් සභාව විසින් විධිමත්ව උපයෝජනය කර නොතිබුණි.

## 5.6 වෙනත් රජයේ ආයතන සඳහා සම්පත් ලබාදීම

(අ) පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් රු.11,000,000 ක් වටිනා කොබෙල්කෝ එක්ස්කවේටර් යන්ත්‍රයක් අම්පාර ප්‍රාදේශීය වාරිමාර්ග අධ්‍යක්ෂගේ ඉල්ලීම මත 2011 මාර්තු 31 දින අම්පාර ප්‍රාදේශීය වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට මුදා හැර තිබූ අතර ගමන් වියදම්, ක්‍රියාකරුගේ වේතන හා ඉන්ධන සඳහා පැයකට රු.3,500 බැගින් කුලී ගාස්තුවක් ගෙවීමටද එකඟවී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ★ අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂගෙන් ලබාගත් ප්‍රකාශනයට අනුව, 2011 අප්‍රේල් 01 සිට නොවැම්බර් 31 දක්වා පැය 569 ක් අදාළ එක්ස්කවේටර් යන්ත්‍රය උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද අම්පාර වාරි මාර්ග අධ්‍යක්ෂ එකඟ වූ පරිදි රු.1,991,500 ක් වූ කුලී ගාස්තු ඔහුගෙන් ලබාගැනීමට මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

- ★ අම්පාර වාරි මාර්ග අධ්‍යක්ෂගේ ඉල්ලීම මත එක්ස්කවේටර් යන්ත්‍රය මුදා හැර තිබුණද, මුදාහැර තිබූ එම කාර්යය සඳහා යොදා ගැනීමෙන් පසුව එය මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට ආපසු භාරදී නොතිබුණි.

- ★ 2014 සැප්තැම්බර් 25 දින සිදුකරන ලද විගණන පරීක්ෂණයට අනුව, අදාළ එක්ස්කවේටර් යන්ත්‍රය අක්කරෙයිපත්තු ජල සම්පාදන මණ්ඩල කාර්යාල පරිශ්‍රයේ භාවිතා කළ නොහැකි තත්ත්වයෙන් ගාල් කර තිබූ බව නිරීක්ෂණය විය.

- ★ මෙම එක්ස්කවේටර් යන්ත්‍රය මිලදී ගැනීම සඳහා රාජ්‍ය මුදල් විශාල ප්‍රමාණයක් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණද, මෙම එක්ස්කවේටර් යන්ත්‍රයේ පැවැත්ම පිළිබඳ දෙපාර්තමේන්තුව දැනුවත්වී නොතිබුණි.

---

(ආ) නැගෙනහිර පළාතේ වාරි මාර්ග ආශ්‍රිත බොහෝ ගැටළු නිරාකරණය කිරීමේ අරමුණින් සහ අඩ්ඩලච්චේනයි ප්‍රදේශයේ වගාකිරීම සඳහා අතිරේක කුඹුරු ඉඩම් අක්කර 8,000 ක් එකතු කිරීමටද හැකිවන පරිදි පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් 2011 පෙබරවාරි 14 දින රු.19,628,116 ක පිරිවැයකට "බාර්ග් මවුන්ටඩ් එක්ස්කවේටර් කොබෙල්කෝ " යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

★ එක්ස්කවේටර් යන්ත්‍රය අම්පාර වාරි මාර්ග අධ්‍යක්ෂ වෙත ඔහුගේ ඉල්ලීම මත මුදාහැර තිබූ නමුත් මුදා හැරීමේ අරමුණු සඳහා එම යන්ත්‍රය යොදා ගැනීමෙන් පසුව මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට ආපසු භාරදී නොතිබුණි.

★ අම්පාර, පළාත් මාර්ග දෙපාර්තමේන්තුවට එක්ස්කවේටර් යන්ත්‍රය මුදා හැරීම සඳහා එකඟවූ කොන්දේසි වලට අනුව, පළාත් වාරි මාර්ග ඉංජිනේරු (තඹිලුවිල් කොට්ඨාශය) විසින් කාලීන පරීක්ෂණයන් සිදුකර, පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුවට වාර්තා කළ යුතු විය. කෙසේ වුවද ඒ අනුව, කාලීන පරීක්ෂණයන් සිදුකර නොතිබුණි.

★ මෙම එක්ස්කවේටර් යන්ත්‍රය මිලදී ගැනීමේ එක් අරමුණක් වුයේ අතිරේක කුඹුරු අක්කර 8000 ක් වගාව සඳහා එකතු කිරීමයි. කෙසේ වුවද එක්ස්කවේටර් යන්ත්‍රය මිලදී ගෙන වර්ෂ 04 ක් ඉක්මවීමෙන් පසුවද එම අරමුණ මේ දක්වා ඉටුකර ගෙන නොතිබුණි.

## 5.7 කාර්ය මණ්ඩල පරිපාලනය

---

පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) පළාත් සභාවේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,598 | 1,242 | 356 |
| තෘතියික මට්ටම | 1,600 | 1,260 | 340 |
| ද්විතියික මට්ටම | 24,766 | 24,221 | 545 |
| ප්‍රාථමික මට්ටම | 7,196 | 6,293 | 903 |
| | 35,160 | 33,016 | 2,144 |

(ආ) පාසැල් කාර්ය මණ්ඩලය

| දිස්ත්‍රික්කය | අනුමත සේවක සංඛ්‍යාව | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | අතිරික්තය | ඌනතාවය | |
|---|---|---|---|---|---|---|---|
| | විදුහල්පතිවරු | ගුරුවරු | විදුහල්පතිවරු | ගුරුවරු | ගුරුවරු | විදුහල්පතිවරු | ගුරුවරු |
| ත්‍රිකුණාමලය | 342 | 4,496 | 230 | 4,532 | 104 | 112 | 68 |
| මඩකලපුව | 425 | 5,585 | 365 | 5,567 | 30 | 60 | 48 |
| අම්පාර | 514 | 7,007 | 419 | 7,566 | 587 | 95 | 28 |
| එකතුව | 1,281 | 17,088 | 1,014 | 17,665 | 721 | 267 | 144 |

මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවේ කාර්ය මණ්ඩල ඌනතාවය 2,144 ක් විය. කෙසේ වුවද එම පුරප්පාඩු පිරවීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) කල්මුණේ, අම්පාර, අක්කරෙයිපත්තු සහ කින්නියා යන කලාප අධ්‍යාපන කාර්යාලවල පිළිවෙලින් 255, 171, 98 සහ 77 ක් වශයෙන් අතිරික්ත ගුරුවරු සංඛ්‍යාවක් සිටියද, කල්කුඩා, ත්‍රිකුණාමලය, මහ ඔය හා ත්‍රිකුණාමලය උතුර යන කලාප අධ්‍යාපන කාර්යාලවල පිළිවෙලින් 48, 37, 28 සහ 22 වශයෙන් වූ

ඌනතාවයන්, අතිරික්ත ගුරුවරුන් සිටි පාසැල්වලින් මාරු කිරීම මඟින් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(iii) විගණනයට ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2013 ජනවාරි 01 දිනට කල්මුණේ, කලාප අධ්‍යාපන කාර්යාලයේ අතිරික්ත කම්කරුවන් 55 ක් විය. කෙසේ වුවද කම්කරුවන්ගේ පුරප්පාඩු පවතින කලාප කාර්යාල සඳහා එම අතිරික්ත කම්කරුවන් මාරු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(iv) එරාවුර්හි පුද්ගලයන් 51 ක් , තිරුක්කෝවිල්හි පුද්ගලයන් 21 ක් , ත්‍රිකුණාමලයේ පුද්ගලයන් 15 ක්, පදිරිප්පු හි පුද්ගලයන් 11 ක්, සම්මන්තුරෙයි හි පුද්ගලයන් 10 ක් හා මඩකලපුවේ පුද්ගලයන් 02 ක් වශයෙන් ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් ගුරුවරුන් 110 ක් පාසැල් 110 ක පවත්නා පුරප්පාඩු සඳහා විදුහල්පතිවරුන් වශයෙන් වර්ෂ 02 කට වැඩි කාලයක් කටයුතු කර තිබුණි. කෙසේ වුවද විදුහල්පති තනතුරු සඳහා පැවති පුරප්පාඩු පිරවීමට පියවර ගෙන නොතිබුණි.

(v) 2013 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාතේ විදුහල්පතිවරුන් සඳහා පුරප්පාඩු මුළු සංඛ්‍යාව 267 ක් වුවද, විදුහල්පති ශ්‍රේණියට අයත් නිලධාරින් පාසැල් කිහිපයක ගුරුවරුන් ලෙස කටයුතු කර තිබුණි. කෙසේ වුවද සුදුසු තනතුරු සඳහා සුදුසුකම් ලාභීන් පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(vi) පහත සඳහන් අධ්‍යාපන කලාපවල ගණිතය, ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය වැනි ප්‍රධාන විෂයයන් සඳහා අතිරික්ත හා ඌනතා පැවතියද පළාත තුළ අතිරික්ත කාර්ය මණ්ඩලය ඌනතා පැවති ස්ථානවලට යෙදවීම මඟින් තුලනය කිරීමට කටයුතු කර නොතිබුණි.

| අධ්‍යාපන කලාප | ගණිතය | | ඉංග්‍රීසි | | තොරතුරු තාක්ෂණය | |
|---|---|---|---|---|---|---|
| | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය |
| කින්නියා | - | 11 | 04 | - | - | 26 |
| සමන්තුරෙයි | 06 | - | - | 15 | 19 | - |
| තිරුක්කෝවිල් | 01 | - | 03 | - | 05 | - |
| එරාවූර් | - | 12 | - | 35 | - | 15 |
| ත්‍රිකුණාමලය | - | 04 | 09 | - | - | 16 |
| කන්තන්කුඩා | - | 20 | - | 31 | - | 11 |
| පදිරිප්පු | - | 59 | - | 08 | - | 15 |
| මඩකලපුව | - | 23 | - | 42 | - | 27 |
| එකතුව | 07 | 129 | 16 | 131 | 24 | 110 |

**5.8 බැංකු සැසඳුම්**

පළාත් අමාත්‍යාංශ 02 ක් හා පළාත් දෙපාර්තමේන්තු 10 ක් විසින් නිකුත් කරන ලද වටිනාකම රු.675,241 ක් වූ ඉදිරිපත් නොකරන ලද චෙක්පත් 98 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම්කටයුතු භාවය හා යහ පාලනය**

**6.1 ක්‍රියාකාරී සැලැස්ම**

පළාත් සභාව සහ එහි එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැසුම් පිළියෙල කර නොතිබුණි.

**6.2 විගණන හා කළමනාකරණ කමිටුව**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට එක් වතාවක් හෝ රැස්විය යුතු යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ පළාත් දෙපාර්තමේන්තු 22 ක් විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**6.3 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පළාත් සභාවේ පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන විසින් පිළියෙල කර නොතිබුණි.

**6.4 වාර්ෂික වාර්තාව සභාගත කිරීම**

පත් වූ නැගෙනහිර පළාත් සභාව 2008 මැයි 10 දින සිට බලපැවැත්වෙන පරිදි එහි කටයුතු ආරම්භ කර තිබුණද, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව, 2011 හා 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 ඔක්තෝබර් 30 දක්වා සභාවේ සභාගත කර නොතිබුණි.

**6.5 නිරවුල් නොකරන ලද විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ**

මඩකලපුව දිස්ත්‍රික්කයේ රැකියා විරහිත තරුණයින් 250 කට කොරියන් භාෂාව ඉගැන්වීමේ පන්ති පැවැත්වීම සඳහා පළාත් අරමුදලින් අත්තිකාරමක් වශයෙන් 2008 වර්ෂයේදී රු.2,000,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද කොරියන් භාෂා පන්ති අත්හිටවූ අතර, අපේක්ෂා කළ පරිදි පාඨමාලා අවසන් කර නොතිබුණි. තවද ප්‍රධාන අමාත්‍යවරයාගේ හිටපු ලේකම්වරයාට ගෙවන ලද අත්තිකාරම 2013 ඔක්තෝබර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් විස්තරාත්මක හා ප්‍රවර්ධනාත්මක වාර්තාවක් මාසයක් ඇතුළත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ ලේකම්වරයාට 2013 ඔක්තෝබර් 14 දින නියෝග කරන ලදි. එහෙත් මෙතෙක් එම වාර්තාව කමිටුවට ඉදිරිපත් කර නොතිබුණි.

**7. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) වාහන උපයෝජනය
(ඊ) සේවක පරිපාලනය